# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/67 - 2018 ජූලි මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ ධීවර හා ජලජ සම්පත් පිළිබඳ ප්‍රඥප්ති කෙටුම්පත පහතින් සඳහන් කරමි.

ගාමිණී තිලකසිරි,
බස්නාහිර පළාත්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 ජුනි මස 20 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාත්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව
නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

2018 අංක ....... දරන බස්නාහිර පළාත් ධීවර හා ජලජ සම්පත් පිළිබඳ ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ සමුද්‍ර ජල තීරයේ මෙන්ම අභ්‍යන්තර ජලාශවල ධීවර කර්මාන්තය විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ ධීවර ප්‍රජාවගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලකට මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ද ;

එකී කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට පළාත් ධීවර අධ්‍යක්ෂක ධූරයක් ස්ථාපනය සඳහා ද, පළාත තුළ ධීවර කටයුතු පවත්වාගෙන යාම සඳහා උපදේශක සභාවක් පත්කිරීම සඳහා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක කිරීමේ දිනය

1. මේ ප්‍රඥප්තිය 2018 අංක .......... දරන බස්නාහිර පළාත් ධීවර සහ ජලජ සම්පත් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් තම අනුමැතිය දෙනු ලබන දින සිට බලපැවැත්විය යුතු ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## I වන කොටස

### *බස්නාහිර පළාත් ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පිහිටුවීම*

බස්නාහිර පළාත් ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2. (මෙම ප්‍රඥප්තියේ මින්මතු අධ්‍යක්ෂක යනුවෙන් හඳුන්වනු ලබන) බස්නාහිර පළාතේ ධීවර අධ්‍යක්ෂක යනුවෙන් හඳුන්වනු ලබන ධුරයක් මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්යය කරගෙන යාම සඳහා පිහිටුවිය යුතු ය.

පළාත් ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා පත්කිරීම.

3. (1) අධ්‍යක්ෂක බස්නාහිර පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය.

(2) අධ්‍යක්ෂකවරයා ලේකම්වරයාගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(3) මේ ප්‍රඥප්තියෙහි කාර්යය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයෙකු සහ කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක භාරව කටයුතු කිරීම සඳහා සහකාර ධීවර අධ්‍යක්ෂවරු තිදෙනෙකු සහ අනෙකුත් අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත්කළ හැකි ය.

(4) අධ්‍යක්ෂවරයා විසින් තමන් වෙත මෙම ප්‍රඥප්තිය යටතේ පවරන බලතල කිසිවක් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් නිලධරයකු වෙත පැවරිය හැකි ය.

(5) අධ්‍යක්ෂවරයා ඇතුළු සෙසු නිලධරයන් පත් කිරීම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියට අනුකූල වන්නේ ය.

ධීවර අධ්‍යක්ෂකගේ කාර්යයන්

4. පළාත් ධීවර අධ්‍යක්ෂවරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියක සඳහන් විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන මූලික කාර්යය භාරයන් ඉටු කළ යුතු ය. එනම් :-

(1) බස්නාහිර පළාතේ සමුද්‍ර ජල තීරයේ මෙන්ම අභ්‍යන්තර ජලාශවල ධීවර කර්මාන්තය විධිමත්ව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා පියවර ගැනීම ;

(2) බස්නාහිර පළාතේ ධීවර වෘත්තිකයන්ගේ වෘත්තිය හා සමාජයීය සුභ සාධනය සඳහා කටයුතු කිරීම ;

(3) බස්නාහිර පළාතේ පාරිභෝගික ජනතාව වෙත අවශ්‍ය ප්‍රමාණයට, මාළු සහ මත්ස්‍ය නිෂ්පාදන සාධාරණ මිලකට ලබාදීමට හැකිවන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ;

(4) බස්නාහිර පළාතේ ධීවර වෘත්තිකයන්ගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණෙන් බස්නාහිර පළාත තුළ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සුදුසු ක්‍රම වේදයන් හඳුන්වා දීම ;

(5) බස්නාහිර පළාතේ මත්ස්‍ය නිෂ්පාදනයේදී සෞඛ්‍යාරක්ෂිත මෙන්ම ගුණාත්මක බව සඳහා හේතුවන පරිදි අයිස් භාවිතය සහ ශීතාගාර භාවිතය පිළිබඳ ධීවර ප්‍රජාව දැනුවත් කිරීම හා නියාමනය කිරීම ;

(6) දේශීය සහ විදේශීය වෙළඳපොළේ ඉල්ලුමක් පවතින, ගුණාත්මක බවෙන් උසස් මත්ස්‍ය වර්ග සහ විසිතුරු මසුන් නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් සලසා දීම සහ ඒ සඳහා සුදුසු වෙළඳපොළ හඳුන්වා දීම ;

(7) බස්නාහිර පළාත තුළ විසිතුරු මසුන් ඇති කිරීම, ගෘහස්ථ මත්ස්‍ය වගාව ස්වයං රැකියා මාර්ගයක් ලෙස ව්‍යාප්ත කිරීම ;

(8) අවම වශයෙන් බස්නාහිර පළාතේ සෑම ප්‍රධාන නගරයකම නවීන මෙන්ම සෞඛ්‍යාරක්ෂිත මාළු අලෙවිසැල් පවත්වාගෙන යාම, මාළු රැගෙන එන වෙරළ තීරයන්හි සහ මාළු රැගෙන එන බෝට්ටු ආදියෙහි අයිස් සහ ශීතාගාර භාවිතය සඳහා පහසුකම් ඇති කිරීම ;

(9) බස්නාහිර පළාතේ ජලජ පරිසරය සහ ජලජ සම්පත් සහ දේශීය මත්ස්‍ය විශේෂ සංරක්ෂණය කිරීම ;

(10) බස්නාහිර පළාතේ ධීවර කර්මාන්තයේ නිරත ධීවර වෘත්තිකයන්ගේ වෘත්තීය මෙන්ම අනෙකුත් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම ;

(11) පෞද්ගලික අංශයේ දායකත්වය සහ ප්‍රජා සහභාගිත්වය ඇතිව ජලජීවී වගා ව්‍යාපෘති ඇති කිරීම ;

(12) කලපු ආශ්‍රිත ඉස්සන් වගාව සඳහා යටිතල පහසුකම් සහ අවශ්‍ය අනෙකුත් පහසුකම් සපයා දීම ;

(13) නාගරික ප්‍රදේශවල මිරිදිය මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(14) මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීම මගින් අවශ්‍ය මත්ස්‍ය පැටවුන් සුලභ කිරීම ;

(15) ධීවර ක්ෂේත්‍රයේ නියැලි ධීවර වෘත්තිකයන් සඳහා අවශ්‍ය පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(16) බස්නාහිර පළාතේ ධීවර වෘත්තිකයන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රම හඳුන්වාදීම ;

(17) ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය යන ආයතන සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම තුළින් ධීවර ප්‍රජාවට අවශ්‍ය සහය සේවාවන් ලබා දීමට කටයුතු කිරීම ;

## II වන කොටස

### *ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව*

5. අමාත්‍යවරයා විසින් (මෙහි මින්මතු ''උපදේශක සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන) බස්නාහිර පළාත් ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව යනුවෙන් හඳුන්වනු ලබන උපදේශක සභාවක් ස්ථාපිත කරනු ලැබිය යුතු ය. බස්නාහිර පළාතේ ධීවර හා ජලජ සම්පත් උපදේශක සභාව ස්ථාපිත කිරීම.

6. I උපදේශක සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. උපදේශක සභාවේ සංයුතිය

(1) ධීවර කර්මාන්තය පිළිබඳ නිපුණතාවයක් හා විශේෂඥ දැනුමක් ඇති අයගෙන් අමාත්‍යවරයා පත්කරනු ලබන දෙදෙනෙකු ;

(2) පළාතේ අදාළ ධීවර ප්‍රජාව නියෝජනය කරන නියෝජිතයෙකු ;

(3) 1996 අංක 2 දරන ධීවර හ ජලජ සම්පත් පනත යටතේ පිහිටුවනු ලැබූ ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාලවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු ;

(4) කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කවල ධීවර කර්මාන්තයේ නියුතු ධීවර වෘත්තිකයන් නියෝජනය වන පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයන් තිදෙනෙකු ;

II I වන උප වගන්තියෙහි (1) අනු වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් අයෙක් උපදේශක සභාවේ සභාපතිවරයා වන්නේ ය.

7. උපදේශක සභාව විසින් පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම කළ යුතු යඃ- උපදේශක සභාවේ කාර්යය සහ කර්තව්‍ය

(1) පළාතේ ධීවර කටයුතු සහ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පළාත් අමාත්‍යවරයා විසින් උපදේශක සභාව වෙත යොමු කරන කරුණු සම්බන්ධයෙන් පළාත් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(2) පළාත් ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.

8. (1) උපදේශක සභාවේ සෑම පත්කළ සාමාජිකයකුම ඔහු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය අතහැරියහොත් මිස අවුරුදු තුනක කාලයකට ධුරය දැරිය යුතු අතර විනය කරුණු මත ඉවත්කළහොත් මිස නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය. පත්කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන

(2) පළාත් අමාත්‍යවරයා විසින් එය එසේ කිරීම සුදුසු යැයි සිතන්නේ නම් යම් පත්කළ සාමාජිකයකු හේතු දක්වා ඉවත් කළ හැකිය.

(3) යම් පත් කළ සාමාජිකයකුට කවර හෝ වේලාවකදී ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා අමතන ලිපියක් මඟින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එකී ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසු බලපැවැත්විය යුතු ය.

(4) යම් පත් කළ සාමාජිකයකුගේ මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ ධුරය හිස් වීම සිදුවූ අවස්ථාවකදී පළාත් අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන සැලකිල්ලකට ගෙන ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය. එසේ පත්කරනු ලබන තැනැත්තා ඔහු විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) උපදේශක සභාවේ රැස්වීම් වාර තුනකට හේතු නොදන්වා සහභාගි නොවීමෙන් උපදේශක සභාවේ සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි වන්නේ ය.

රැස්වීම් වලට පැමිණීම සඳහා වූ පාරිශ්‍රමික

9. උපදේශක සභාවේ සාමාජිකයන්ට එකී සභාවේ රැස්වීම් වලට පැමිණීම සඳහා පළාත් අමාත්‍යවරයා විසින් පළාත් මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

රීති සෑදීමට ඇති බලය

10. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් ධීවර අධ්‍යක්ෂකට අදාළ කාර්යයන් නියමානුකූලව පවත්වා ගැනීම සම්බන්ධයෙන් හා ඊට ආනුශාංගික කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළකිරීමෙන් අනතුරුව මාස තුනක් ඇතුලත අනුමැතිය සඳහා පලාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ සාදනු ලබන රීති පළාත් සභාව විසින් අනුමත කර, අනුමැතිය පිළිබඳ ගැසට් නිවේදනයක් පළකිරීමෙන් අනතුරුව එකී රීති බලාත්මක වන්නේ ය.

ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලතල

11. සාමාන්‍ය විධිවිධාන

(1) පළාත් ධීවර අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරය ලැබූ යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන පිළිපදිනු ලබන බව සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ කවර හෝ වේලාවක පූර්ව දැනුම්දීමක් නොමැතිව යම් පරිශ්‍රයකට ඇතුළුවී :-

(අ) එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම ;

(ආ) එකී පරිශ්‍රයේ මත්ස්‍ය වර්ග, උපකරණ ආදිය පරීක්ෂා කිරීම, ඒවායේ සාම්පල ලබාගැනීම, එහි යම් පරිභෝජනයට නුසුදුසු මත්ස්‍ය වර්ගයක්, වෙනත් ද්‍රව්‍යයක් හෝ නීති විරෝධී උපකරණයන් ආදිය ඇත්නම් ඒවා අත්අඩංගුවට ගැනීම ;

(ඇ) එහි සිටින ඕනෑම තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම ;

(ඈ) එය තුළ පවත්වාගෙන යන යම් රෙජිස්ටරයක් හෝ වාර්තා හෝ පරීක්ෂා කිරීම සහ එකී රෙජිස්ටරයේ හෝ වාර්තාවේ පිටපත් ගැනීම ; සහ

(ඉ) එකී පරිශ්‍රය භාරව සිටින යම් තැනැත්තෙකුට මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය විය හැකි උචිත පියවර ගැනීමට නියම කිරීම කළ හැකි ය.

පළාත් ධීවර අධ්‍යක්ෂවරයා විසින් පොලීසියේ සහය ලබා ගැනීම.

12. (1) මේ ප්‍රඥප්තිය යටතේ කාර්යය සහ කර්තව්‍ය කරගෙන යාමේ කාර්යය සඳහා පළාත් ධීවර අධ්‍යක්ෂවරයා පොලීසියේ සහය ඉල්ලා සිටිය හැකි අතර එකී සහය ලබාදීම පොලීසියේ කාර්යභාරය විය යුතු ය.

විෂ හෝ පුපුරණ ද්‍රව්‍ය යොදා මසුන් ඇල්ලීම, විකිණීම ආදිය වරදක් බව.

13. වැරදි සහ දඬුවම්.

(1) කිසිදු තැනැත්තෙකු විසින් :-

(අ) බස්නාහිර පළාත් සභාවට අයත් සමුද්‍ර තීරයෙහි හෝ අභ්‍යන්තර ජලාශ වල මසුන් ඇල්ලීමේ දී හෝ වෙනත් ජලජ සම්පතක් ලබාගැනීමේදී විෂ සහිත, පුපුරණ හෝ විසඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට තැත් කිරීම නොකළ යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් කාර්යයන් සඳහා විෂ සහිත, පුපුරණ හෝ විසඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් භාවිතා කිරීමේ චේතනාව පෙන්නුම් කරන පර්යේෂණ යටතේ එවැනි යම් විෂ සහිත, පුපුරණ හෝ විසඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් රැගෙන යාම හෝ තම සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය ;

(ඇ) යම් මත්ස්‍යයකු හෝ වෙනත් ජලජ සම්පතක් ලබාගෙන ඇත්තේ විෂ සහිත, පුපුරණ හෝ විසඥභාවයට පත්කරන යම් ද්‍රව්‍යයක් භාවිතා කොට බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු තිබියදී, එවැනි යම් මත්ස්‍යයෙකු හෝ වෙනත් යම් ජලජ සම්පතක් ගොඩ දැමීම, විකිණීම, මිලට ගැනීම, භාර ගැනීම, තම සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය ;

(ඈ) විෂ සහිත, පුපුරණ හෝ විසඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් බස්නාහිර පළාත් සමුද්‍ර තීරයෙහි හෝ අභ්‍යන්තර ජලාශවල තැබීම, තැන්පත් කිරීම, දැමීම හෝ පිටවීමට සැලැස්වීම නොකළ යුතු ය ;

(ඉ) තහනම් කරනු ලැබූ ධීවර ආම්පන්න කිසිවක් බස්නාහිර පළාතේ ධීවර කටයුතු සඳහා භාවිතා කිරීම හෝ තම සන්තකයේ තබා ගැනීම හෝ යම් දේශීය ධීවර බෝට්ටුවක් තුළ තබා ගැනීම හෝ තහනම් කරනු ලැබූ මසුන් ඇල්ලීමේ ක්‍රමයක් උපයෝගී කරගැනීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය ;

(ඊ) බස්නාහිර පළාත තුළ පිහිටි අභ්‍යන්තර ජලාශවල කවර හෝ කොටසක අඟල් තුනහමාරකට (අඟල් 3 1/2) ට අඩු ඇස් සහිත කවර හෝ දැලකින් මාළු ඇල්ලීම නොකළ යුතු ය ;

(2) මෙම වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේදී රුපියල් දහදාහක දඩයකට හෝ මාස හයක් (06) නොඉක්මවන කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය ;

14. (1) කිසියම් තැනැත්තකු විසින් බස්නාහිර පළාත තුළ :-

පරිභෝජනයට නුසුදුසු මසුන් විකිණීම ආදිය වරදක් බව

(අ) විෂ සහිත හෝ කල් ඉකුත්වී ගිය හෝ මිනිස් පරිභෝජනයට නුසුදුසු මත්ස්‍ය වර්ගයක් හෝ මත්ස්‍ය නිෂ්පාදනයක් විකිණීම, විකිණීම සඳහා තැබීම හෝ නිෂ්පාදනය කිරීම ;

(ආ) මසුන් හෝ මත්ස්‍ය වර්ගයක් කල් තබා ගැනීම හෝ නිෂ්පාදනය සඳහා විෂ සහිත හෝ මනුෂ්‍ය පරිභෝජනය නුසුදුසු ද්‍රව්‍යයක් භාවිත කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කවර හෝ විධි විධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට හෝ මාස 06 ක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

විවිධ වැරදි

15. (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ තම බලතල ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තෙකුට යම් යුක්තිසහගත හේතුවක් නොමැතිව බාධා කරන ;

(ආ) මේ ප්‍රඥප්තියේ අධිකාරිය යටතේ ක්‍රියා කරන පුද්ගලයෙකු වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරන අතරතුර හෝ ඉටුකරන අතරතුර අන් අයට පීඩාකාරී ආකාරයෙන් හෝ අන් අය ප්‍රකෝප කරවන ආකාරයෙන් හැසිරෙන හෝ ක්‍රියා කරන ;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන පුද්ගලයෙකු වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කරන විට හෝ තම කර්තව්‍යය ඉටුකරන විට ඒ හා සම්බන්ධව තමාට ලැබුණු යම් තොරතුරක්, එකී තොරතුරු හෙළිකිරීම සඳහා මේ ප්‍රඥප්තිය මගින් අවසර දී ඇති කාර්යය හැර, වෙනත් කාර්යයක් සඳහා යම් තැනැත්තෙකුට හෙළි කරන ;

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ තමන් හට පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව ක්‍රියා කරමින් ඉදිරිපත් කළ යුතු යම් වාර්තාවක් හෝ යම් තොරතුරක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ තමන් විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක් මගින් හෝ තොරතුරු මගින් දැන දැනම යම් ව්‍යාජ ප්‍රකාශයක් කරන හෝ ;

(ඉ) මේ ප්‍රඥප්තියේ හෝ එය යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් යටතේ තමන්ට දෙනු ලබන යම් විධානයක් පිළිපැදීමට අපොහොසත් වන ;

සෑම තැනැත්තෙකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වරදක් කරන හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ දඬුවමක් ප්‍රකාශිතව සළසා නොමැති යම් වරදක් සිදුකරනු ලබන යම් තැනැත්තෙකු ; මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කිරීමේදී, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් යම් පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන විටක,

(අ) එකී පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එකී සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙකුම සහ අදාළ නිලධරයකුම ;

(ආ) එකී පුද්ගල මණ්ඩලය වෙළඳ ව්‍යාපාරයක් නම් එකී වෙළඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම එකී වරද සඳහා වරදකරුවෙකු ලෙස සැළකිය යුතු ය.

එසේ වුවද, එකී අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ එකී වෙළඳ ව්‍යාපාරයේ හවුල්කරු හෝ විසින් එකී වරද සිදුකරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔප්පුකරන්නේ නම් ඔහු එකී වරද සඳහා වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

(4) අධ්‍යක්ෂකගේ ලිඛිත අවසරය ලැබූ යම් නිලධරයකු හෝ සේවකයෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු කටයුතු කිරීමේ කාර්යය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ අර්ථානුකූලව රජයේ නිලධරයකු ලෙස සළකනු ලැබිය යුතු ය.

දඩ මුදල් පළාත් සභා අරමුදලට ගෙවිය යුතු ය.

16. මේ පනත යටතේ කරන ලද වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් නියම කරන ලද දඩ මුදල පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

අර්ථ නිරූපණය

17. අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි කාර්යයන් සඳහා

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ ධීවර විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

''අභ්‍යන්තර ජලාශ'' යන්නට බස්නාහිර පළාතේ භූමි සීමාව තුළ පිහිටි ගංගා, වැව්, පොකුණු, ඇළ මාර්ග, උල්පත් සහ වෙනත් කවර වුවද පොදු මිරිදිය ජලාශයක් අදහස් වේ ;

''ජල සම්පත්'' යන්න සජීවී ජලජ ඓන්ද්‍රිකයන් අදහස් වන අතර, ජලජ මාධ්‍යයක දක්නට ලැබෙන මුහුදු පැළෑටි, ශාඛ ප්ලවාංග හෝ වෙනත් ජලජ උද්භිද වර්ග සහ අජීවී ද්‍රව්‍ය ඊට ඇතුළත් වේ ;

''ජලජීවී වගා ව්‍යාපෘති'' යන්නට නිෂ්පාදනය වැඩි කිරීමේ කාර්යය සඳහා මිනිස් පාලනය යටතේ ජලජ ජීවී ප්‍රජනනය කිරීමේ සිට ජලජ ජීවියෙකුගේ ජීවන චක්‍රයේ යටත් පිරිසෙයින් එක් අදියරක් මෙහෙයවීම දක්වා වූ පරාසය තුළ ජලජ ශාක සහ ජීවීන් ඇති කිරීම අදහස් වේ.

''මසුන් හෝ මත්ස්‍යයින්'' යනුවෙන් මත්ස්‍ය ගණයට අයත් වන හෝ නොවන හෝ කවර වුවද ජලජ ජීවියෙකු අදහස්වන අතර, යම් පොතු සහිත මත්ස්‍යයෙක්, කවච මත්ස්‍යයෙක්, මුතු බෙල්ලෙක්, මෘද්වංගිකයෙක්, හොලෝකූරියාවෙක් හෝ ජලජ ක්ෂීරපායී සත්වයෙක් හෝ එවැනි ජීවීන්ගේ පැටවු බිත්තර හෝ අණ්ඩපාත සහ ප්ලවාංග ඇතුළත් වේ.

''පළාත'' යන්නෙන් බස්නාහිර පළාත අදහස් වේ.

''පළාත් ධීවර අධ්‍යක්ෂවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා අදහස් වේ.

''ලේකම්වරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

07 - 926

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.